ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

## නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

AIIB

# කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහයදීම - AIIB

## පුරප්පාඩු - ව්‍යාපෘති අධ්‍යක්ෂ 01

අඩු ආදායම්ලාභී ප්‍රජාවගේ නිවාස තත්ත්වයන් වැඩිදියුණු කිරීම සහ කොළඹ ඉඩම් භාවිතයේ කාර්යක්ෂමතාවය වැඩි කිරීම සඳහා නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය රජය විසින් 2011 වසරේදී ආරම්භ කරන ලදි. දැරිය හැකි නිවාස 50,000 ක් ඉදිකිරීම සහ ගොඩකරන ලද ඉඩම් ප්‍රතිසංවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. කොළඹ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියට සහාය දීම (SCURP) යටතේ නිවාස ඒකක 5,500 ක් ඉදිකිරීම සහ කොළඹ නගරයේ සහ නගරාසන්න ප්‍රදේශයේ ඉඩම් සංවර්ධනය සඳහා මූල්‍යාධාර ලබාදීමේ මෙම ප්‍රාරම්භය සඳහා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව උපකාර කරයි. SCURP සඳහා වන මුළු පිරිවැය ඇමරිකානු ඩොලර් මිලියන 280 කි. එයින් ඇ.ඩො. මිලියන 200 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) විසින් ලබාදෙනු ලැබේ. මෙම ව්‍යාපෘතිය නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරවීම හා ප්‍රජා පවිත්‍රතා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ඉටුකරන අතර, නාගරික සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කෙරේ.

ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර පිරවීම සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම් හා පළපුරුද්ද ලත් පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**කළමනාකරණ චක්‍රලේඛ අංක 01/2019 පරිදි PS level 1, 5th Band**
(පහත 1 හෝ 2 හෝ 3)

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබාතිබීම

සහ

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 16 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 8 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ විය යුතුය.

02. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක්

හෝ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය / සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

සමග

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 14 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 07 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ විය යුතුය.

03. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අදාළ ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම

හෝ

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස පිළිගනු ලබන සුදුසුකමක් ලබා තිබීම.

සහ

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබීම

සමග

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ආයතනික / වරලත් සාමාජිකත්වය හෝ සමාන වෘත්තීය සුදුසුකමක් ලබා තිබීම

සමග

කළමනාකරු මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබිය යුතු අතර, එයින් වසර 06 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරු මට්ටමේ තිබිය යුතුය.

### වැටුප් පරිමාණය සහ පොදු කොන්දේසි :

වැටුප්, 2019.03.15 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 සහ අනෙකුත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛ ප්‍රකාරව පදනම් වේ. අයදුම්කරුවන් ශ්‍රී ලාංකීය පුරවැසියන් විය යුතු අතර, වයස අවුරුදු 64 ට වැඩි නොවිය යුතුය.

### සේවා නියමයන් හා කොන්දේසි :

රජයේ සේවකයන් 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ 2.3.3 වගන්තිය ප්‍රකාරව බඳවා ගනු ලබන අතර, රාජ්‍ය සේවාවට පිටස්තර අයවලුන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගනු ලැබේ. පත්වීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කරන අතර, එය මුලින් වසරක කාලයක් සඳහා වන අතර, අපේක්ෂකයාගේ කාර්යසාධනය මත වාර්ෂිකව කොන්ත්‍රාත්තුව අලුත් කරනු ලැබේ.

### තෝරාගැනීමේ ක්‍රමය :

සුදුසුකම් හා පළපුරුද්ද මත කෙටි ලැයිස්තුගත කළ අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

### අයදුම්පත් :

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සම්පූර්ණ විස්තර හා දුරකථන අංකය හා ඊමේල් ලිපිනය ඇතුළු අනෙකුත් අදාළ තොරතුරු සඳහන් කරමින් A4 ප්‍රමාණයේ කඩදාසියේ අයදුම්පත තමන් විසින්ම සකසා ගන්නාමෙන් අපේක්ෂකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. අයදුම්පත්, 2020 සැප්තැම්බර් 07 වෙනි දින හෝ ඊට පෙර ලැබෙන පරිදි පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් එවිය යුතුය. අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"SCURP - ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය. රාජ්‍ය / ආයතනික අංශයේ අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තමන්ගේ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතු අතර, පහත සඳහන් ලිපිනය වෙත පිටපතක් කෙළින්ම කලින් යොමු කළ යුතුය.

**ලේකම්,**
**නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය,**
**17 වන මහල, සුහුරුපාය,**
**බත්තරමුල්ල.**